

**ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනිඳුන්ගේ පිහිට ලබාගැනීමට ප්‍රාර්ථනාව**

ස්වාමිනි කරුණාකළ මැනව.

ක්‍රිස්තුනි කරුණාකළ මැනව.

ස්වාමිනි කරුණාකළ මැනව.

ක්‍රිස්තුනි අපේ ප්‍රාර්ථනා අසා වදාළ මැනව.

ක්‍රිස්තුනි අපේ ප්‍රාර්ථනා ගිවිස වදාළ මැනව.

පරමණ්ඩලවල වැඩ ඉඳින පිතාවන දෙවියනි,

**අපට දයා කළමැනව.**

ලෝකය නිදහස් කළාවූ පුත්‍රවන දෙවියනි,

**අපට දයා කළමැනව.**

ස්ප්‍රිතු සාන්තුවන දෙවියනි,අපට දයාකළ මැනව.

**අපට දයා කළමැනව.**

සුපරිශුද්ධ ත්‍රිත්තිවයවූ ඒක දෙවියනි,

**අපට දයා කළමැනව.**

ශුද්ධවූ මරියනි,

**අපට දයා කළමැනව.**

ශුද්ධවූ දේව මෑණියනි,

**අපට දයා කළමැනව.**

1. ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,
   **අප නිසා යාච්ඤා කළ මැනව.**
2. අති ලාබාල වයසේදීම අති මුහුකුරා ගිය ඥාණයක් ප්‍රකාශවූ ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,
   **අප නිසා යාච්ඤා කළ මැනව.**
3. ළදරු වයසේ පටන් පරහට දයාවෙන් පිරී සිටියාවූ ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,
   **අප නිසා යාච්ඤා කළ මැනව.**

4. දවිඳු රජමෙන් දිළිඳු එඩ්රෙක්ව පසුව දෙවියන්ගේ සෙනගට ආණ්ඩුකාරයාද,ඥාණගෝපාලයා ද වුණාවු ශුද්ධවු විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

5. වහල්කමට අසුව සිටි අවස්ථාවේදී සම්පූර්ණ නිදහස පැවැත්තුවාවු ශුද්ධවු විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

6. විශ්වාසයෙන් ජීවත්වුන ධර්මිෂ්ඨ මනුෂ්‍යයා වන්නා වු ශුද්ධවු විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

7. ක්‍රිස්තියානි බලාපොරොත්තුව නමැති ස්ථිර නැංගුරමෙන් නිතරතුරු රක්ෂණාවුණාවු ශුද්ධවු විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

8. දයාව නමැති ගින්නෙන් නිරතුරු දැල්වී සිටියාවු ශුද්ධවු විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

9. සැබැවින්ම නිරහංකාරව අවංකව දේව භය ඇතිව පැවතුණාවු ශුද්ධවු විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

10. නිරතුරු මෘදුව හෘදයෙන්ම බැහැපත්ව ක්‍රිස්තුස් ස්වාමිදරුවන්ගේ සත්‍ය ගෝලයාව සිටියාවු ශුද්ධවු විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

11. හෘදයෙහිත්,චිත්තයෙහිත් නිරතුරු මර්දනය පැවැත්තුවාවු ශුද්ධවු විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

12. ජේසුස් ක්‍රිස්තුස් ස්වාමිදරුවන්ගේ ජ්වලිතාධ්‍යාසයෙන් නිරතුරු උනන්දුව සිටියාවු ශුද්ධවු විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

13. දේව මහිමය වර්ධනය කිරීමට ගත් උත්සාහවලෙහි තෘප්තියට නොපැමිණියාවු ශුද්ධවු විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

14. මනුෂ්‍යාත්මයන් කෙරෙහි අභ්‍යන්තර දයාගින්නකින් නිරතුරු ඇවිල භාග්‍යවු ජ්වලිත උත්සාහයකින් නිරතුරු ක්‍රියාකළාවු ශුද්ධවු විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

15. සුවිශේෂයෙහි කියන ලද අමිල වු මුතුඇටයත් මහත් නිධානයත් ක්‍රිස්තියානි දිළිඳුකමෙහි සොයා ගත්තාවු ශුද්ධවු විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

16. පිරිසිදුකමින් දේවදුතයන්ට සමවන්නාවු ශුද්ධවු විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

17. කීකරුකමෙහි නිතර විශ්වාසපක්ෂව වචනයෙහි නිරතුරු ජයග්‍රහණය කළාවු ශුද්ධවු විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

18. ඉතා බාලාවස්ථාවේ සිටම දානාදී පරහට දයා කිරීමෙහි තත්පරවු ශුද්ධවු විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

19. ඉතා ස්වල්ප වශයෙන් වුවත් නපුරයයි පෙනීගිය දේවලින් පලායාමට ඉතා උනන්දුව ක්‍රියා කළාවු ශුද්ධවු විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

20. සියලු ක්‍රියාවලෙහි ධර්මගුණ සම්පූර්ණත්වයට පැමිණීම සෙව්වාවු ශුද්ධවු විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

21. ලෝකය නමැති චණ්ඩ මාරුතයෙන් ඇලලී ගිය සමුද්‍රයෙහි නිශ්චලව පැවති පර්වතයවූ ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

22. ගමන් පථයෙහි නොකඩවා යෙදී සිටින්නාවූ සූර්යයාසෙයින් සැබෑ ප්‍රඥා මාර්ගවල නිරතුරු ඉදිරියට ගමන් කළාවූ ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

23. විපත්ති නමැති ශරප්‍රහාර එකකින්වත් පසු නො බැස සිටියාවූ ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

24. ක්ෂමාදානයෙහි යුහුසලු වුවාක්මෙන්ම දුඃඛ වේදනා දැරීමෙහි ඉවසිලි ඇතිවූ ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

25. ශුද්ධවූ රෝමානු සභාවේ නිරතුරු අවනත කීකරු පුත්‍රවන ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

26. දුර්ලබ්ධි වේද භේදයෙහි අමුතු මාර්ගයන් හා කපටි වචන කෙරෙහි අධික ලෙස භය ඇතිව සිටියාවූ ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

27. දිළිඳුන්ට සුවිශේෂය දෙසීමට දෙවියන් විසින් විශේෂයෙන් තෝරාගනු ලද්දාවූ ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

28. ගුරුප්‍රසාදීන්ගේ දයාබර පියාණන්ද සම්පූර්ණ ආදර්ශයද වන්නාවූ ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

29. මීසම් සමාගම් ස්ථාපිත කිරීමෙන් ප්‍රඥාවන්තකම ප්‍රකාශවුණාවූ ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

30. දයාවේ කන්‍යාස්ත්‍රීන්ගේ සමාගම පිහිටුවීමෙන් ඥාණවන්තකම ප්‍රකාශවුණාවූ ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

31. දුගීන්ගේ අගහිගකම් කෙරෙහි නිරතුරු මොලොක් දයානුකම්පා දක්වමින් ඔවුන්ට පිළිසරණවීමෙහි නිරතුරු යුහුසුලුවූ ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

32. යාච්ඤාකිරීමෙහිත් දේව වාක්‍ය දෙසීමෙහිත් ඒකාකාර ජ්වලිතව සිටියාවූ ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

33. ජේසුස් ක්‍රිස්තුස් ස්වාමිදරුවන්ගේ චරිතයත් ධර්මගුණවලුත් සම්පූර්ණ ලෙස අනුසාර කළාවූ ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

34. අයහපත් දේ වැළකීමත්,යහපත් දේ ඉස්ට කිරීමත් දිවි හිමියෙන් ඉෂ්ටකළාවූ ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

35. ජීවිත කාලයේදීත්,මරණ අවස්ථාවේදීත් දෙවියන් අභිමුඛයෙහි අත්‍යානර්ඝව සිටියාවූ ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

36. පරම සත්‍යයන් දැනගැන්මෙනුත් මහෝත්තම යහපත් ප්‍රේම කිරීමෙනුත් අනන්ත භාග්‍ය ප්‍රීතියෙන් පිණාසිටීමෙනුත් සම්පූර්ණ සැපත භුක්තිවිඳින්නාවූ ශුද්ධවූ විසෙන්ති පාවුලු මුනින්ද්‍රයනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

ලෝක පාපවල් හරින දේවාජබාලකවූ ජේසුනි,

**අපට ක්ෂමා කළමැනව ස්වාමි.**

ලෝක පාපවල් හරින දේවාජබාලකවූ ජේසුනි,

**අපේ ප්‍රාර්ථනා අසා වදාළ මැනව ස්වාමි.**

ලෝක පාපවල් හරින දේවාජබාලකවූ ජේසුනි,

**අපට දයා කළමැනව ස්වාමි.**

ශුද්ධවූ සභාවෙහි සභාගීන් උදෙසාත් විශේෂ කොට මේ සහෝදර පංක්තියෙහි සාමාජිකයන් උදෙසාත් යාච්ඤා කළමැනව.

පදය – දෙවියන් වහන්සේ ධර්මිෂ්ඨයා නිසිමඟින් ගෙනගිය සේක.

ප්‍රත්‍යුත්තරය – ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යයද පෙන්වා දුන් සේක.



**යාච්ඤා කරම්හ.**

සර්වේශ්වර වූ දෙවියනි!දිළිඳුන්ට සුවිශේෂය දේශනා කිරීම පිණිසත්,දුඃඛිතයන් සැනසීම පිණිසත්,අසරණයන්ට පිළිසරණවීම පිණිසත්,පූජාප්‍රසාදී තත්වය අමුතු ප්‍රභවයකින් උජ්වලිතකරවීම පිණිසත් අප මේ වර්තමාන කාලයේදීම ඔබගේ භාග්‍යවන්ත දාසයාවන විසෙන්ති පාවුලු මුනිඳුන්ගේ අපෝස්තලික දයාවත් බැහැපත්කමත් මාර්ගයෙන් ඔබගේ අති ස්නෙහස පුත්‍රයාණන් ගේ ජ්වලිත් අධ්‍යාසය අලුත් කරන්නට ඔබගේ අපරිමිත දයායහපත්කමින් ඔබවහන්සේ අභිමත වී වදාළ සේක් වේද?අපත් පාපය නමැති මහත් කාලක්ණ්ණි තත්වයෙන් මිදී,විසෙන්ති මුනිඳුන් පරිචිත කළ බැහැපත්කම අනුසාර කිරීමෙන් ඔබවහන්සේ සතුටු කිරීමට උත්සාහ කරන සැටියට එතුමාගේ මධ්‍යස්ථකමින් අපට වරම් දෙවා වදාරණවා සොඳේ.

මෙකීදේ අපේ ස්වාමිවූ ජේසුස් ක්‍රිස්තුස් උදෙසාම ලැබේවා - ආමෙන්.